# 6

# ක්ලෝඩ් මොනේ සහ උපස්ථිතිවාදයේ ආරම්භය

*එම්. පාලින්ද රසාංගිත් මැදගේ* [1]
HU / 2011 / 0623

මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් මොනේ පිළිබඳවත්, ඔහුගේ සිතුවම් කලාවේ ලක්ෂණ උපස්ථිතිවාදයේ ආරම්භය කෙරෙහි බලපෑ ආකාරය පිළිබඳවත් කතාබහ කරනු ලැබේ. ක්ලෝඩ් මොනේ සහ උපස්ථිතිවාදයේ ආරම්භය පිළිබඳ කරුණු සොයා ගත් ක්‍රමවේදයන් වුයේ අන්තර්ජාල භාවිතය, පොතපත පරිශීලනය සහ ආචාර්යවරුන්ගෙන් විමසා එක්රැස් කරගත් කරුණුය. උපස්ථිතිවාදයේ ආරම්භය සඳහා බලපෑ ඔහුගේ විරෝධයේ මුඛ්‍ය ලක්ෂය වුයේ පැරීසියානු කලාව මත ඇකඩමියේ සාමාජිකයන් පැතිරවූ දැඩි ග්‍රහණයයි. මොනේ මුලික කරගනිමින් උපස්ථිතිවාදී ව්‍යාපාරය බිහිවීමේ ආරම්භය සිදු විය. මෙලෙස ඔහුට බලපෑ කරුණු අතර 1789 දී ඇති වූ ප්‍රංශ විප්ලවයේ යථාර්ථයන්, නැපෝලියානු යුද්ධ පිළිබඳ මතකයන්, තුන්වෙනි නැපෝලියන්ගේ ප්‍රතිපත්ති, කාලීනව සිදුවූ කුමන්ත්‍රණ, ප්‍රංශ පර්සියානු යුද්ධය, ප්‍රංශ කොමියුනයේ බිඳ වැටීම මෙන්ම තුන්වෙනි සමුහාණ්ඩුවේ යථාර්ථ ද ඔහුගේ සමීප සමාජ අත්දැකීම් විය. මොනේගේ චරිතය ස්වකීය ළමාවිය, තුරුණුවිය සහ පරිණත වීමේ අවධි පසු කළේ කෙළවරක් නැති දේශපාලන අර්බුද සහ ලේවැගරීම් පසුබිමෙහිය. විශේෂයෙන්ම මොනේගේ කෘති දෙස බලන විට පෙනෙන එක් වැදගත් පොදු කරුණක් වන්නේ ඔහු තමන් අවට ගොඩනැගෙමින් පැවති අලුත් බලවත්වූ සහ ධනවත්වූ නව මධ්‍යම පන්තියක විවිධ සමාජ ක්‍රියාවන්ට සාපේක්ෂව ඒවා දෙස දුර සිට බලන්නෙකු හෝ සැහැල්ලු බලන්නෙකු ලෙස පමණක් ක්‍රියාත්මක වු බවයි. යම් වස්තුවක් සිත්තම් කිරීමේ දී එය එම අවස්ථාවේ දර්ශනය වන සජීව ආකාරයට ම සිත්තම් කරනු මිස, එම වස්තුව පිළිබඳ අපදන්නා හා අවබෝධ කරගෙන සිටිනා දැනුම අනුව, එනම් මළගිය මතකය අනුව සිත්තම් කිරීම තුළ කලාවක් නැතැ'යි ඔහු විශ්වාස කළේය. මොනේගේ එක් සිතුවමක් මේ සියල්ල සඳහා ප්‍රබල බලපෑමක් එක් කළ අතර එය නම් කරනු ලැබුවේ උපස්ථිතිවාදී හිරු උදාව (Impression, Sunrise) ලෙසය. Salon de Paris නම් කලා ප්‍රදර්ශනය මගින් ප්‍රතික්ෂේප වු නිර්මාණ ශිල්පීන් කිහිප දෙනෙකුගේ එකතුවකින් ප්‍රථම උපස්ථිතිවාදී කලා ප්‍රදර්ශනය පවත්වනු ලබයි. එයට මුලිකත්වය ගනු ලැබුවේ ද මොනේ ය. මොනේගේ ඉහත සිතුවමහි තේමාව මෙම කලා ව්‍යාපාරයට පටබැඳීම ද ඔහුගේ දායකත්වය කෙතරම් මෙම කලා ව්‍යාපාරය කෙරෙහි බලපෑ බව ගම්‍ය වෙයි. නිගමනය වශයෙන් උපස්ථිතිවාදයේ ආරම්භය කෙරෙහි ඍජු දායකත්වය ලබා දීම මොනේගේ අතින් සිදුවූ බව කිව හැකි ය.

මුඛ්‍ය පදඃ උපස්ථිතිවාදය, ප්‍රංශ විප්ලවය, උපස්ථිතිවාදී හිරු උදාව, පැරීසියානු කලාව

---

*1 දෘශ්‍යකලා හා සැලසුම්කරණය (විශේෂවේදී) තෙවන වසර*